සියලු ම හිමිකම් ඇවිරිණි.

# ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය

## AA3 විභාගය - 2015 ජූලි

## (AA34) ක්‍රියාවලීන්, පාලනයන් සහ විගණනය

(Processes, Controls and Audit)

2015-08-01
පස්වරු
[2.00 – 5.00]

පිටු ගණන : 09
ප්‍රශ්න ගණන: 10

- **අයදුම්කරුවන්ට උපදෙස්** (අවධානයෙන් කියවිය යුතුය):

(1) *කාලය: පැය 03 යි.*

(2) ***ප්‍රශ්න පත්‍ර ව්‍යුහය සහ ලකුණු වෙන් කිරීම:***

| කොටස | අවශ්‍යතාවය | ලකුණු |
|---|---|---|
| A | සියලුම ප්‍රශ්න වලට උත්තර සැපයීම අනිවාර්ය වේ. | 20 |
| B | සියලුම ප්‍රශ්න වලට උත්තර සැපයීම අනිවාර්ය වේ. | 30 |
| C | ප්‍රශ්න තුනෙන් දෙකකට පමණක් උත්තර සැපයිය යුතුය. | 50 |
| **මුළු ලකුණු** | | 100 |

(3) *ඉල්ලුම් කරන ලද **මාධ්‍යයෙන්, එක් භාෂාවකින් පමණක්,** ඔබ වෙත සපයන ලද **පොත්වල උත්තර** ලියන්න.*

(4) *ගණනය කිරීම් සහ පෙරවැඩ අමුණන්න. උපකල්පන කිසිවක් ඇතොත්, ඒවා පැහැදිලිව දක්වන්න.*

(5) *වැඩසටහන් ගතකිරීම කළ නොහැකි ගණක යන්ත්‍ර **පමණක්** භාවිත කිරීමට ඉඩ දෙනු ලැබේ.*

(6) *අර්ථකථන සහිත **කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව** අමුණා ඇත. සෑම ප්‍රශ්නයක්ම කළ යුතු ක්‍රියාවකින් යුක්ත වේ. කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුවේ එම ක්‍රියාව සඳහා දී ඇති අර්ථකථනය පදනම් කරගෙන අයදුම්කරුවන් විසින් ප්‍රශ්නය සඳහා අවශ්‍ය උත්තර සැපයිය යුතුය.*

---

## A කොටස

අනිවාර්යය ප්‍රශ්න හතර (04) කි.

(මුළු ලකුණු 20)

### 01 වන ප්‍රශ්නය

**සීමාසහිත ගැලක්සි (පෞද්ගලික) සමාගම** ඔවුන්ගේ ව්‍යවස්ථාපිත විගණකයන් ලෙස **එන් එන් ඇසෝසියේට්ස්** නම් වූ වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනයක් පත් කරන ලදී. මූල්‍ය ප්‍රකාශන විගණනය කිරීම සහ මූල්‍ය ප්‍රකාශන වල සත්‍ය හා සාධාරණ බව පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම විගණකවරයාගේ වගකීම වේ.

(a) සහතික වීමේ කාර්යභාරයකට (Assurance Engagement) සම්බන්ධ පාර්ශව තුන(03) **හඳුනා දක්වන්න**.

(ලකුණු 03)

(b) **සීමාසහිත ගැලක්සි (පෞද්ගලික) සමාගමේ** විගණකයන් ලෙස **එන් එන් ඇසෝසියේට්ස්** විසින් ප්‍රදර්ශනය (demonstrate) කළයුතු මූලික ආචාර ධර්මීය මූලධර්ම (fundamental principles in the Code of Ethics) දෙකක්(02) **සඳහන් කරන්න**.

(ලකුණු 02)

(මුළු ලකුණු 05)

## 02 වන ප්‍රශ්නය

**කාන්චන** සීමාසහිත පෞද්ගලික සමාගමක එක දිගට / පුනරාවර්තීව කරගෙන යනු ලබන (recurring) විගණනයක, විගණන කාර්යයේ නියුක්ත කළමනාකරු වේ. ඔහුගේ ක්ෂේත්‍ර විගණන වැඩකටයුතු (field work) ආරම්භ කිරීමට පෙර ස්ථාවර විගණන ලිපිගොනුව සමාලෝචනය කිරීමේදී කලින් නිකුත් කර තිබුණු සේවයේ යෙදවීමේ ලිපිය (previous engagement letter) ස්ථාවර විගණන ලිපිගොනුවේ ගොනුගත (filed) කර ඇති බව දක්නා ලදී.

(a) එක දිගට කරගෙන යන (recurring) විගණන සේවාදායකයෙකු සම්බන්ධයෙන් වූ සේවයේ යෙදවීමේ ලිපියක ඇතුලත් කළ යුතු කරුණු තුනක්(03) **සඳහන් කරන්න**. (ලකුණු 03)

(b) ස්ථාවර විගණන ලිපිගොනුවක ඇතුලත් කළ යුතු වෙනත් තොරතුරු දෙකක්(02) **සඳහන් කරන්න**. (ලකුණු 02)

(මුළු ලකුණු 05)

## 03 වන ප්‍රශ්නය

විගණන සාක්ෂි යනු විගණන මතය සඳහා පදනම් කර ගැනීම පිණිස විගණක විසින් එළඹෙන්නා වූ නිගමන වලට පාදක වන විගණක විසින් ප්‍රයෝජනයට ගනු ලබන සියලුම තොරතුරු වේ.

(a) විගණන සාක්ෂිවල විශ්වසනීයත්වය කෙරෙහි බලපාන සාධක දෙකක්(02) **සඳහන් කරන්න**. (ලකුණු 02)

(b) තිබිය හැකි සම්බන්ධිත පාර්ශව ගනුදෙනු (related party transactions) හඳුනාගනු පිණිස විගණකයෙකු විසින් සිදුකරනු ලබන ක්‍රියාපටිපාටීන් තුනක්(03) **සඳහන් කරන්න**. (ලකුණු 03)

(මුළු ලකුණු 05)

## 04 වන ප්‍රශ්නය

ඔබ **W ඇසෝසියේට්ස්** නමැති වරලත් ගණකාධිකාරිවරුන්ගේ ආයතනයක, විගණන කළමනාකරු වේ. මූල්‍ය සමාගමක් වන **GT හෝල්ඩින්ග්ස් පොදු සමාගමේ,** විගණනය කරගෙන යාම සඳහා ඔබට විගණන කණ්ඩායමක් ලබා දී ඇත. ඔබ හා විගණනය බාර හවුල්කරු **GT හෝල්ඩින්ග්ස් පොදු සමාගමේ** විගණන කමිටුව සමග රැස්වීමක් පැවැත්වීමට නියමිතව ඇත.

(a) ඔබ විසින් **GT හෝල්ඩින්ග්ස් පොදු සමාගම** සම්බන්ධව එහි කර්මාන්තය, නියාමන සහ වෙනත් බාහිර සාධක යටතේ දැනුම ලබා ගතයුතු සාමාන්‍ය ක්ෂෙත්‍රයන් (general areas) තුනක්(03) **සඳහන් කරන්න**. (ලකුණු 03)

(b) විගණන කමිටුවේ කාර්යයන් දෙකක්(02) **හඳුනා දක්වන්න**. (ලකුණු 02)

(මුළු ලකුණු 05)

*A කොටසෙහි අවසානය*

# B කොටස

අනිවාර්යය ප්‍රශ්න තුන (03) කි.

(මුළු ලකුණු 30)

## 05 වන ප්‍රශ්නය

**සීමාසහිත ෆැෂන්ස් ට්‍රෙන්ඩ් (පෞද්ගලික) සමාගම** නිෂ්පාදන සමාගමකි. සමාගමේ කර්මාන්තශාලාවේ වැඩකරන සේවක සංඛ්‍යාව 200 ඉක්මවයි. එම සේවකයන්ට මාසිකව වැටුප්, අතිකාල ගෙවීම් සහ පැමිණීමේ දීමනා ගෙවනු ලැබේ.

සමාගමේ සේවක පිරිවැටුම (employee turnover) සාපේක්ෂව ඉහලය. මානව සම්පත් අංශය විසින් සමාගමේ වැටුප් ලේඛනය (payroll) පිළියෙල කරන අතර මූල්‍ය ගණකාධිකාරී විසින් එය පරීක්ෂා කරනු ලැබේ. වැටුප් ලේඛනය සාමාන්‍යාධිකාරී විසින් අනුමත කිරීමෙන් අනතුරුව සෑම සේවකයෙකුගේම ශුද්ධ වැටුප ඔවුන්ගේ අදාල බැංකු ගිණුම්වලට යවනු ලැබේ.

2015 අප්‍රේල් මාසය සඳහා වැටුප් ගෙවීමෙන් පසුව අලුතින් සේවයට බැඳුනු සේවකයන් හතර දෙනෙකු ඔවුන්ගේ වැටුප් ඔවුන්ගේ බැංකු ගිණුම්වලට යවා නොමැති බවට පැමිණිලි කළ අතර තවත් සේවකයන් 10 දෙනෙකු ඔවුන්ගේ අතිකාල දීමනා අඩුවෙන් ගෙවා ඇති බවට පැමිණිලි කර ඇත.

කළමනාකාරිත්වයට දැන් වැඩිපුර වැටුප් ගෙවීම් ද සිදුවී ඇත්දැයි යන්න ගැන අවධානය යොමු කිරීමේ අවශ්‍යතාවයක් පැන නැගී ඇත.

**ඔබ විසින්,**

(a) අස්තිත්වයක වංචා ඇතිවීමේ අවදානම වැඩි කරනු ලබන තත්ත්වයන් හෝ සිද්ධීන් තුනක්(03) **සඳහන් කරන්න.** (ලකුණු 03)

(b) වංචාවක් සම්බන්ධයෙන් වූ කළ විගණකවරයාගේ වගකීම **පැහැදිලි කරන්න.** (ලකුණු 03)

(c) එහි සේවකයන්ට අඩුවෙන් හෝ වැඩියෙන් වැටුප් ගෙවීමේ අවදානම තුනී කර ගැනීම (mitigate) සඳහා **සීමාසහිත ෆැෂන්ස් ට්‍රෙන්ඩ් (පෞද්ගලික) සමාගමට** ක්‍රියාත්මක කිරීම සඳහා සලකා බැලිය හැකි පාලනයන් හතරක්(04) **හඳුනා දක්වන්න.** (ලකුණු 04)

(මුළු ලකුණු 10)

## 06 වන ප්‍රශ්නය

**නලින්** ජංගම දුරකතන, ටැබ්ලට් පරිගණක සහ ඊට සම්බන්ධිත උපාංග වෙළඳාමේ යෙදී සිටින **සීමාසහිත ඩයල් ස්පීඩ් (පෞද්ගලික) සමාගමේ** විගණනය භාරව කටයුතු කරන විගණන කළමනාකරුය. සමාගමට රටේ ප්‍රධාන නගරවල පිහිටුවන ලද විකුණුම් මධ්‍යස්ථාන ඇත. සමාගමේ විගණනය සිදු කිරීමේදී සංශය දෘෂ්ඨියකින් හෙබි මනසකින් (skeptical mind) යුතුව එය කළ යුතු බවට සැලසුම්කරණ රැස්වීමේදී **නලින්** ඔහුගේ විගණන කණ්ඩායමට උපදෙස් දෙන ලදී.

සමාගම, නව මාදිලියක ජංගම දුරකතනයක් වෙළෙඳපොලට හඳුන්වා දී ඇති බවත් එම නිසා පැරණි මාදිලියේ ජංගම දුරකතන නොවිකිණී තිබීමේ අවදානමක් ඇති බවත් **නලින්** ප්‍රකාශ කර තිබේ.

**ඔබ විසින්,**

(a) "වෘත්තිය සංශය දෘෂ්ඨිය" (Professional Skepticism), "වෘත්තිය විනිශ්චයෙන්" (Professional Judgment) **වෙනස්කොට දක්වන්න.** (ලකුණු 05)

(b) **සීමාසහිත ඩයල් ස්පීඩ් (පෞද්ගලික) සමාගමේ** අවසාන තොගයේ, අගය කිරීම යන සැඳහුම ආවරණය (address) කිරීම සඳහා විගණකවරයා විසින් ඉටුකළ යුතු විගණන ක්‍රියාපටිපාටින් දෙකක්(02) **පැහැදිලි කරන්න.** (ලකුණු 05)

(මුළු ලකුණු 10)

## 07 වන ප්‍රශ්නය

(a) **සීමාසහිත සිලෝන් නෙට්වක්ස් (පෞද්ගලික) සමාගම** 2007 අංක 07 දරණ සමාගම් පනත යටතේ ලියාපදිංචි කළ අලුතින් ආරම්භ කරන ලද සමාගමකි. සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය සමාගමේ ප්‍රථම විගණකවරයා පත්කිරීම පිළිබඳව සලකා බලමින් සිටී.

**ඔබ විසින්,**

(i) සමාගමේ විගණකවරයෙකු ලෙස පත්වීමක් ලැබීමට නුසුදුසු වන තැනැත්තන් දෙදෙනකු(02) **සඳහන් කරන්න**. (ලකුණු 02)

(ii) සමාගමේ ප්‍රථම විගණකවරයා පත්කිරීමේ ක්‍රියාවලිය **පැහැදිලි කරන්න**. (ලකුණු 03)

(b) 2015 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා **සීමාසහිත එනර්ජි බෙවරේජස් පොදු සමාගමේ** මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණන වාර්තාවේ උද්ධෘතයක් පහත දී ඇත:

*විගණන වාර්තාවේ උද්ධෘතය:*

> ***මතය සඳහා පදනම***
>
> සමාගමේ විගණකවරයන් ලෙස අපව පත් කරන ලද්දේ **2014** ජුනි **30** දින බැවින් වර්ෂයේ ආරම්භයේ පැවති තොග ගණන් ගැනීම නිරීක්ෂණය කිරීමට අප සහභාගී නොවීය. **2014** මාර්තු **31** දිනට පැවති තොග ප්‍රමාණයන් පිළිබඳව විකල්ප ක්‍රම මගින් ද අපට සහතික වීමක් ලබා ගැනීමට නොහැකි විය. මූල්‍ය කාර්යසාධනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශ සැකසීම සඳහා ආරම්භක තොගය ඇතුළත් වන බැවින් වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශයේ වාර්තා කර ඇති ලාභය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ වාර්තා කර ඇති මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය සම්බන්ධයෙන් යම් කිසි ගැළපීම් අවශ්‍යවනු ලබන්නේදැයි යන්න තීරණය කිරීමට අපට නොහැකි විය.
>
> ***මතය***
>
> මතය සඳහා පදනම් වූ ඡේදයේ සඳහන් කරුණු වලින් වියහැකි බලපෑම් හැර, **සීමාසහිත එනර්ජි බෙවරේජස් පොදු සමාගමේ** මූල්‍ය ප්‍රකාශන වලින් **2015** මාර්තු **31** දිනට සමාගමේ මූල්‍ය තත්ත්වය ද, එදිනෙන් අවසන් වූ වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය සහ එහි මුදල් ප්‍රවාහයන් ද ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතයන්ට අනුකූලව සෑම ප්‍රමාණාත්මක කරුණු අතින්ම සාධාරණ ලෙස ඉදිරිපත් කර ඇති බව අපගේ මතය වේ.

**ඔබ විසින්,**

2015 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා **සීමාසහිත එනර්ජි බෙවරේජස් පොදු සමාගමට** නිකුත් කර ඇති විකරණය (modified) කළ විගණන මතය කුමන වර්ගයේ එකක් ද යන්න **හඳුනා දක්වන්න**. එවැනි මතයක් ප්‍රකාශ කිරීමට තුඩු දී ඇති හේතුව **පැහැදිලි කරන්න**. (ලකුණු 05)

(මුළු ලකුණු 10)

*B කොටසෙහි අවසානය*

# C කොටස

ප්‍රශ්න දෙකකට (02) පමණක් උත්තර සැපයිය යුතුය.

(මුළු ලකුණු 50)

## 08 වන ප්‍රශ්නය

(a) අභ්‍යන්තර පාලන පද්ධති ආකෘතිමය රාමුවේ සංරචක පහ(05) **සඳහන් කරන්න**. (ලකුණු 05)

(b) ප්‍රසම්පාදන ක්‍රියාවලියක (procurement process) ඇති අවදානම් තුනක්(03) **හඳුනා දක්වන්න**. එසේ හඳුනාගත් එක් එක් අවදානම තුනී කර ගැනීමට පාලනයක් බැගින් **සඳහන් කරන්න**. (ලකුණු 06)

(c) **සීමාසහිත SH ඉන්ටර්නැෂනල් (පෞද්ගලික) සමාගම** පාරිභෝගික භාණ්ඩ නිෂ්පාදනය කරන සමාගමකි. මෙම සමාගමට දිවයින පුරා පත්කර ඇති නියෝජිතයන් මගින් ක්‍රියාත්මක කරනු ලබන බෙදාහැරීමේ ජාලයක් ඇත.

නියෝජිතයන් සිය ඇණවුම් සමාගමේ ගිණුම් විධායකයෙකු වන **ශිරෝමා** වෙත දුරකතනය මගින් ඉදිරිපත් කරනු ලැබේ. ඇය මෙම ඇණවුම්, සටහන් පොතක වාර්තාගත කරන අතර අනතුරුව ඉන්වොයිසිය පිළියෙල කර එය ගබඩා කළමනාකරු වෙත යවනු ලැබේ. ඉන්වොයිසිය ප්‍රකාරව භාණ්ඩ අදාළ ස්ථානයට යවනු ලැබේ.

ආපසු එවන ලද භාණ්ඩ ගබඩා කළමනාකරු විසින් භාණ්ඩ ආපසු එවීමේ පත්‍රයක (Return Note) සටහන් කරනු ලැබේ. **ශිරෝමා** මෙම භාණ්ඩ තොග ආපසු එවීම් සඳහා බැර පත්‍ර (Credit Notes) පිළියෙල කරන අතර ඒවා ණයගැති ලෙජරයට ඇතුලත් කරයි.

**වාහිඩ් මහත්මිය** විකුණුම් කළමනාකාරිණිය වන අතර ඇය අමුද්‍රව්‍ය මිලට ගැනීම සඳහා මුදල් ප්‍රමාණවත් නොවන විට නියෝජිතයන්ට දුරකතනයෙන් කතාකර මුදල් ගෙවන ලෙස ඉල්ලීම් කරයි. **ශිරෝමා** නියෝජිතයන්ගෙන් ලැබෙන මුදල් පිළිබඳ සටහන් තබා ගන්නා අතර ණයගැතියන්ගෙන් ලැබිය යුතු මුදල් ලේඛනය පවත්වා ගනී. 2015 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය තුළදී බොල්ණය වශයෙන් රු. මිලියන 12.5 ක් ලියාහරින ලදී. එක් එක් මාසයක් අවසානයේ දී **ශිරෝමා** ගබඩාවේ ඇති තොග නියැදියක් සම්බන්ධයෙන් භෞතික සත්‍යාපනයක් (physical verification) ක්‍රියාවට නංවයි.

**ඔබ විසින්,**

(i) ඉහත විස්තර කරන ලද අභ්‍යන්තර පාලන පද්ධතියේ ඇති අභ්‍යන්තර පාලන දුර්වලතා හතරක්(04) **හඳුනා දක්වන්න**. (ලකුණු 04)

(ii) මෙම එක් එක් දුර්වලතාවය ඔබ මගහරවා ගන්නේ කෙසේදැයි **පැහැදිලි කරන්න**. (ලකුණු 06)

(iii) **සීමාසහිත SH ඉන්ටර්නැෂනල් (පෞද්ගලික) සමාගමේ** විකුණුම් ක්‍රියාවලිය මත කළමනාකරණය විසින් ක්‍රියාත්මක කළ යුතු පාලනයන් දෙකක්(02) **හඳුනා දක්වන්න**. එම පාලනයන්, වැළැක්වීමේ (preventive) පාලනයන්ද නැත්නම් අනාවරණ (detective) පාලනයන්දැයි යන්න **සඳහන් කරන්න**. (ලකුණු 04)

(මුළු ලකුණු 25)

## 09 වන ප්‍රශ්නය

(a) තත්ත්ව පාලන පද්ධතියක මූලිකාංග තුනක්(03) **පැහැදිලි කරන්න**. (ලකුණු 06)

(b) පරිගණක වැඩසටහන් (computer programmes) වලට සිදුකරන අනවසර වෙනස්වීම් වැළැක්වීම හෝ අනාවරණය කර ගැනීම තොරතුරු තාක්ෂණ පොදු පාලනය (IT general control) කි.

(i) අස්තිත්වයක, තොරතුරු තාක්ෂණ පොදු පාලනයන් ක්‍රියාත්මක කිරීමේ අරමුණ **පැහැදිලි කරන්න**. (ලකුණු 04)

(ii) අස්තිත්වයක පරිගණක වැඩසටහන් වලට සිදුකරන අනවසර වෙනස්කම් වැළැක්වීම හෝ අනාවරණය කර ගැනීම සඳහා අස්තිත්වයට සලකා බැලිය හැකි පාලන හතරක්(04) **හඳුනා දක්වන්න**. (ලකුණු 04)

(c) **සුනිල්** කාර්යාල හා ගෘහස්ථ භාවිතය සඳහා වන ලී බඩු නිෂ්පාදනය කරන සමාගමක් වන **සීමාසහිත ඩිසයින් ෆර්නිචර් (පෞද්ගලික) සමාගමේ,** මූල්‍ය විගණනය බාරව කටයුතු කරන ජ්‍යෙෂ්ඨ විගණකයා වේ. සමාගම සතුව නිට්ටඹුවේ හා හොරණ පිහිටි නිෂ්පාදන පිරියත දෙකක් ඇත. ප්‍රධාන කාර්යාලය කොළඹ පිහිටා ඇත. දිවයිනේ විවිධ ප්‍රදේශ වල පිහිටි සමාගමට අයත් ප්‍රදර්ශනාගාර හරහා විකුණුම් සිදුකෙරේ. එක් එක් ප්‍රදර්ශනාගාරය ගනුදෙනුකරුවන්ගෙන් ඇණවුම් බාරගන්නා අතර ඒවා තොරතුරු තාක්ෂණ පද්ධතියේ ඇතුලත් කරනු ලැබේ. ප්‍රදර්ශනාගාර කාර්යමණ්ඩලයට තොරතුරු තාක්ෂණ පද්ධතියේ වූ තොග සහ ඉන්වොයිස් නිකුත් කිරීමේ අංශ (sections) වලට ප්‍රවේශවීමේ අවසරය තිබෙන අතර තොරතුරු තාක්ෂණ පද්ධතිය සමාගමේ ගිණුම්කරණ පද්ධතියට සම්බන්ධ කර ඇත. මූල්‍ය දෙපාර්තමේන්තුව, ප්‍රසම්පාදන දෙපාර්තමේන්තුව සහ තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුව ප්‍රධාන කාර්යාලයේ පිහිටුවා ඇත.

සමාගමේ 2015 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා කෙටුම්පත් කළ මූල්‍ය ප්‍රකාශන සහ 2014 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, අදාල සටහන් සමග පහත දී ඇත:

**විස්තීර්ණ ආදායම් ප්‍රකාශය** *(රු.'000)*

| **මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය** | **2015** | **2014** |
|---|---|---|
| විකුණුම් | 1,200 | 900 |
| විකුණුම් පිරිවැය | (865) | (620) |
| **දළ ලාභය** | **335** | **280** |
| විකුණුම් හා බෙදාහැරීමේ වියදම් | (85) | (54) |
| පරිපාලන වියදම් | (43) | (34) |
| **මෙහෙයුම් ලාභය** | **207** | **192** |
| මූල්‍ය වියදම් | (20) | (16) |
| **බද්දට පෙර ලාභය** | **187** | **176** |
| බදු වියදම | (75) | (58) |
| **වර්ෂය සඳහා ලාභය** | **112** | **118** |
| වෙනත් විස්තීර්ණ ආදායම | - | - |
| **වර්ෂය සඳහා මුළු විස්තීර්ණ ආදායම** | **112** | **118** |

**මූල්‍ය තත්ත්ව ප්‍රකාශය** *(රු.'000)*

| **මාර්තු 31 දිනට** | **2015** | **2014** |
|---|---|---|
| **ජංගම නොවන වත්කම්:** | | |
| දේපළ, පිරියත හා උපකරණ | 890 | 695 |
| **ජංගම වත්කම්:** | | |
| තොග | 98 | 75 |
| වෙළෙඳ හා වෙනත් ලැබිය යුතු දෑ | 30 | 22 |
| මුදල් හා මුදල් වලට සමාන දෑ | 85 | 50 |
| | 213 | 147 |
| | **1,103** | **842** |
| **ස්කන්ධය සහ වගකීම්:** | | |
| ප්‍රකාශිත ප්‍රාග්ධනය | 390 | 350 |
| රඳවාගත් ඉපැයීම් | 320 | 202 |
| | 710 | 552 |
| **ජංගම නොවන වගකීම්:** | | |
| ණය ගැනීම් | 150 | 115 |
| නිර්වචිත ප්‍රතිලාභ බැඳීම් (Defined Benefit Obligations) | 20 | 15 |
| | 170 | 130 |
| **ජංගම වගකීම්:** | | |
| වෙළෙඳ හා වෙනත් ගෙවිය යුතු දෑ | 134 | 100 |
| ණය ගැනීම් | 89 | 60 |
| | 223 | 160 |
| | **1,103** | **842** |

**2015 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ගිණුම්වලට සටහන්:**

(1) වර්ෂය තුළදී සමාගම පැරණි නිෂ්පාදන යන්ත්‍ර සූත්‍ර සමහරක් ලියා හැර ඇති අතර අලුත් යන්ත්‍ර සූත්‍ර මිලදී ගෙන ඇත.

(2) වර්ෂය තුළදී සමාගම හොරණ පිහිටි ගබඩාවක් තුන්වන පාර්ශවයකට කුලියට දෙන ලද අතර අමතර ගබඩාවක් නිට්ටඹුවේ ඉදිකරන ලදි.

**සීමාසහිත ඩිසයින් ෆර්නිචර් (පෞද්ගලික) සමාගමේ** විගණනයේ ඇති අවදානම් තක්සේරු කිරීමේ කාර්යය **සුනිල්** වෙත පවරා ඇත.

**ඔබ විසින්,**

(i) **සීමාසහිත ඩිසයින් ෆර්නිචර් (පෞද්ගලික) සමාගමේ** විගණනයේදී ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශ (අවප්‍රකාශ) ඇතිවීමේ අවදානම හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා **සුනිල්** ට ඉටුකළ හැකි අවදානම් තක්සේරු කිරීමේ ක්‍රියාපටිපාටින් පහක්(05) **සඳහන් කරන්න**. (ලකුණු 05)

(ii) ඉහත සඳහන් තොරතුරු මත පදනම්ව **සීමාසහිත ඩිසයින් ෆර්නිචර් (පෞද්ගලික) සමාගම** විගණනය කිරීමේදී **සුනිල්** විසින් අවධානය යොමු කිරීමට අවශ්‍ය වන ක්ෂෙත්‍රයන් (areas) තුනක්(03) **හඳුනා දක්වන්න**.

(ලකුණු 06)

(මුළු ලකුණු 25)

## 10 වන ප්‍රශ්නය

(a) ශ්‍රී ලංකා විගණන ප්‍රමිත 570 (SLAuS 570) - අඛණ්ඩ පැවැත්ම ප්‍රකාරව විගණකවරයාගේ වගකීම වන්නේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී කළමනාකරණය විසින් අඛණ්ඩ පැවැත්ම පිළිබඳ උපකල්පනය භාවිත කිරීමේ යෝග්‍යතාවය පිළිබඳ ප්‍රමාණවත් යෝග්‍ය විගණන සාක්ෂි ලබා ගැනීමය.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී අඛණ්ඩ පැවැත්ම පිළිබඳ උපකල්පනය භාවිත කිරීමේ යෝග්‍යතාවය පිළිබඳ සැක මතු කරන මූල්‍ය සිද්ධීන් හෝ තත්ත්වයන් (financial events or conditions) පහක්(05) **සඳහන් කරන්න**.

(ලකුණු 05)

(b) **සීමාසහිත ෆ්ලෙක්ස් ප්ලාස්ටික් (පෞද්ගලික) සමාගම** ප්ලාස්ටික් භාණ්ඩ නිෂ්පාදනය කරන සමාගමකි. සමාගම ඔවුන්ගේ නිෂ්පාදන ක්‍රියාවලිය සඳහා ආනයනය කළ අමුද්‍රව්‍ය භාවිත කරනු ලැබේ.

2015 මාර්තු 31 දිනට සහ 2014 මාර්තු 31 දිනට සමාගමේ තොග සාරාංශය පහත සඳහන් පරිදි විය:

| | **2015 මාර්තු 31 (රු.'000)** | **2014 මාර්තු 31 (රු.'000)** |
|---|---:|---:|
| අමුද්‍රව්‍ය | 125,000 | 90,000 |
| නොනිමි වැඩ | 75,000 | 45,000 |
| නිමි භාණ්ඩ | 365,000 | 245,000 |
| **එකතුව** | **565,000** | **380,000** |

2015 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය හා 2014 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා විකුණුම් හා විකුණුම් පිරිවැය පහත දී ඇත:

| | **2015 මාර්තු 31 (රු.'000)** | **2014 මාර්තු 31 (රු.'000)** |
|---|---:|---:|
| විකුණුම් | 2,000,000 | 1,400,000 |
| විකුණුම් පිරිවැය | (1,720,000) | (1,176,000) |
| **දළ ලාභය** | **280,000** | **224,000** |

***අමුද්‍රව්‍ය***

නිෂ්පාදනය සඳහා ප්‍රධාන අමුද්‍රව්‍ය හතරක් භාවිත කෙරේ. මෙම අමුද්‍රව්‍ය වර්ග හතර තොග මොඩියුලයේ දී (inventory module) ඒවායේ පාට, තරම ආදිය පදනම් කරගෙන තවදුරටත් වර්ග කර ඇත. එකතුව වශයෙන් ගත්කල අමුද්‍රව්‍ය අයිතම 200 ක් පමණ ඇත. මෙම සියලුම අමුද්‍රව්‍ය වල ඒකක මිල සමාන වන අතර පද්ධතිය මගින් ගණනය කරනු ලබන භරිත සාමාන්‍ය පිරිවැයට (weighted average cost) ඒවා අගය කරනු ලැබේ. කෙසේවෙතත්, ගබඩා කළමනාකරුට සහ මුදල් කළමනාකරුට තොග මොඩියුලය සම්බන්ධයෙන් පරිපාලන බලතල (administrative rights) ඇති අතර ඔවුන්ට පද්ධතියේ තිබෙන මිල ගණන් වෙනස් කිරීමට හැකියාව ඇත.

ඔබ මෙම කාර්යභාරයේ ජ්‍යෙෂ්ඨ විගණක වේ.

**ඔබ විසින්:**

(i) විගණන ක්‍රියාපටිපාටි වර්ගයක් වන "නිරීක්ෂණය" (observation) යන්න **පැහැදිලි කරන්න**. එහි සීමාවන් **සඳහන් කරන්න**. (ලකුණු 04)

(ii) 2015 මාර්තු 31 දිනට මෙම සමාගමේ ඇති තොගය පිළිබඳව විගණන සාක්ෂි ලබා ගැනීම සඳහා ඔබ විසින් ඉටු කරනු ලබන විශ්ලේෂණාත්මක ක්‍රියාපටිපාටීන් දෙකක්(02) **හඳුනා දක්වන්න**. (ලකුණු 02)

(iii) 2015 මාර්තු 31 දිනට අමුද්‍රව්‍ය ඇගයීමේ නිරවද්‍යතාවය පරීක්ෂා කිරීම සඳහා ඔබ විසින් ඉටු කරනු ලබන විගණන ක්‍රියාපටිපාටීන් දෙකක්(02) **සඳහන් කරන්න**. (ලකුණු 04)

(c) වෙළෙඳ ලැබිය යුතු දෑ පිළිබඳව විගණන සහායකයකු විසින් පිළියෙල කරන ලද පහත සඳහන් වැඩ පත්‍රිකා (working papers) ඔබගේ සමාලෝචනය සඳහා ඉදිරිපත් කර ඇත:

*වැඩ පත්‍රිකාව*

*පිළියෙල කරන ලද්දේ : s.f.* *දිනය:*
*සමාලෝචනය කරන ලද්දේ: .................* *දිනය:*
*සේවාදායකයා: ................................*

***ණයගැතියන්ගෙන් සනාථ (confirmations) කිරීම් කැඳවීම***

*අප විසින් ණයගැතියන් ලැයිස්තුවේ ඇති 110 ක් වූ ණයගැතියන්ගෙන් පහත සඳහන් ණයගැතියන් 6 දෙනා තෝරාගෙන අපගේ පාලනය යටතේ ඔවුන්ගෙන් ශේෂ සනාථ කිරීම් කැඳවන ලදී.*

| ***ණයගැතියා*** | ***2015 මාර්තු 31 දිනට ශේෂය (රු.)*** | ***පිළිතුරු ලැබුනේද*** | ***සනාථ කළ ශේෂය (රු.)*** | ***වෙනස (රු.)*** |
|---|---|---|---|---|
| *ෆෙයාර් ට්‍රේඩිං* | *150,000* | *නැත* | *N/A* | *N/A* |
| *ඇල්ෆා ට්‍රේඩිං* | *2,678,000* | *නැත* | *N/A* | *N/A* |
| *මාතර ස්ටෝර්ස්* | *55,000* | *ඔව්* | *55,000* | *0* |
| *සමීර සහ සමාගම* | *5,000* | *නැත* | *N/A* | *N/A* |
| *ක්වික් ට්‍රේඩර්ස්* | *86,000* | *ඔව්* | *54,500* | *31,500* |
| *N සහ N (පෞද්ගලික) සමාගම* | *575,000* | *නැත* | *N/A* | *N/A* |

*[N/A = Not Available (දී නොමැත)]*

(i) ඉහත සඳහන් කර ඇති පරිදි විගණන සහායක විසින් ණයගැතියන් සනාථ කිරීම සම්බන්ධව ඉටුකරන ලද විගණන ක්‍රියාපටිපාටි වල ප්‍රමාණවත් භාවය අතින් බලන කල පෙනෙන දුර්වලතා තුනක්(03) **පැහැදිලි කරන්න**. (ලකුණු 06)

(ii) ඉහත සඳහන් වැඩ පත්‍රිකාවේ දක්නට ලැබෙන වෙනත් දුර්වලතා හතරක්(04) **සඳහන් කරන්න**. (ලකුණු 04)

(මුළු ලකුණු 25)

*C කොටසෙහි අවසානය*

# <u>කළ යුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව</u>

| දැනුම් ක්‍රියාවලිය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචන |
|---|---|---|
| 01 මට්ටම<br>අවබෝධය<br><br>වැදගත් තොරතුරු ආවර්ජනය සහ පැහැදිලි කිරීම. | **නිර්වචනය කරන්න** | ස්වභාවය, විෂය පථය හෝ තේරුම නිශ්චිතව ප්‍රකාශ කිරීම. |
| | **අඳින්න** | හැඩයක් හෝ රූපසටහනක් ගෙන හැර දැක්වීම. |
| | **හඳුනා දක්වන්න** | යමක් මනා සැලකිලිමත් වීමකින් අනතුරුව හඳුනා ගැනීම හෝ තහවුරු කිරීම හෝ තෝරා ගැනීම. |
| | **ලැයිස්තුගත කරන්න** | විස්තර කිරීමකින් තොරව අදාළ කරුණු එකින් එක වචනයෙන් ලියා දැක්වීම. |
| | **සම්බන්ධ කරන්න** | තාර්කික හෝ හේතු කාරක සම්බන්ධතාවය පෙන්නුම් කිරීම හෝ තහවුරු කිරීම. |
| | **සඳහන් කරන්න** | යමක් ස්ථිර ලෙස පැහැදිලිව ප්‍රකාශ කිරීම. |
| | **ගණනය කරන්න** | ගණිතමය ගණනය කිරීම. |
| | **විමසන්න** | අවසන් නිගමනයකට පිවිසීම සඳහා විවිධ පැතිකඩ තර්කානුකූලව සවිස්තරව පරීක්ෂා කිරීම. |
| | **පැහැදිලි කරන්න** | අදාළ කරුණු සවිස්තරාත්මකව දැක්වීම. |
| | **අර්ථකතනය කරන්න** | අවබෝධයට පහසු සුපුරුදු පද මගින් අර්ථය ඉදිරිපත් කිරීම. |
| | **හඳුනාගන්න** | සෙවීමෙන් හෝ ප්‍රයත්න දැරීමෙන් නිගමනයකට එළඹීම. |
| | **සටහන් කරන්න** | අදාළ කරුණු විස්තරාත්මකව සටහන් කිරීම. |
| | **සාරාංශගත කරන්න** | කරුණු වශයෙන් හෝ සංඛ්‍යා වශයෙන් ප්‍රධාන කරුණු කෙටියෙන් දැක්වීම. |

| දැනුම් ක්‍රියාවලිය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචන |
|---|---|---|
| 02 මට්ටම<br>භාවිතය<br><br>ඉගෙනගත් පසුබිම නොවන පසුබිමක දැනුම භාවිත කිරීම / සංවෘත ගැටළු විසඳීම. | **භාවිත කරන්න** | ප්‍රායෝගිකව භාවිතයේ යොදන්න. |
| | **තක්සේරු කරන්න** | වටිනාකම, ස්වභාවය, හැකියාව හෝ ගුණාත්මක බව තීරණය කරන්න. |
| | **ප්‍රදර්ශනය කරන්න** | සුවිශේෂී ලෙස උදාහරණ සමග ඔප්පු කරන්න. |
| | **ප්‍රස්තාර දක්වන්න** | ප්‍රස්තාර මගින් නියෝජනය කරන්න. |
| | **පිළියෙල කරන්න** | දී ඇති විස්තර සැලැස්මකට ගොනු කිරීම. |
| | **ප්‍රමුඛතා දක්වන්න** | වැදගත්කම, අනුපිළිවෙල අනුව දක්වන්න. |
| | **සසඳන්න** | තවත් දෙයක් සමග සංගත වේදැයි බැලීම. |
| | **විසඳන්න** | ගණනය කිරීම හා / හෝ පැහැදිලි කිරීම් හරහා විසඳුම් සෙවීම. |

| දැනුම් ක්‍රියාවලිය | ක්‍රියා ලැයිස්තුව | ක්‍රියා නිර්වචන |
|---|---|---|
| 03 මට්ටම<br>විශ්ලේෂණය<br><br>අදහස් අතර සම්බන්ධතා ගොඩනගා සමාන අසමානතා බැලීම / විවෘත ගැටළු විසඳීම. | **විශ්ලේෂණය කරන්න** | විසඳුම් හෝ ප්‍රතිඵලය තීරණය කිරීම පිණිස විස්තරාත්මකව පරීක්ෂා කරන්න. |
| | **සමානකම් බලන්න** | සමානකම් සොයා ගැනීම පිණිස පරීක්ෂා කිරීම. |
| | **අසමානතා බලන්න** | අසමානතා හෝ වෙනස්කම් සෙවීම පිණිස පරීක්ෂා කිරීම. |
| | **වෙනස්කොට දක්වන්න** | යමක් තවෙකෙකින් වෙනස්කොට දක්වන දෑ හඳුනා ගැනීම. |
| | **සැකිල්ලක් සේ දක්වන්න** | සුවිශේෂී ලක්ෂණ සාරාංශ කොට දැක්වීම. |